## 59 – වෙති වෙති හම්පාණෝ

වෙති වෙති හම්පාණෝ රජිඳෝ
තැති ගෙනැ වෙව්ලති ජනතාවෝ
කෙරුබ බලනා තටු පිටැ එතුමෝ
අසුන් අරා සිටිනෝ
පොළොවද කම්පාවේ //

සියොනේ කඳු මතැ සමිඳරුවාණෝ
තෙද බල මහිමෙන් වැජඹෙන්නෝ
සියුලුමැ ජන රුස් මත්තේ එතුමෝ
වෙති වෙති එක අදි පතියොණෝ

උත්’තිත් එතුමන් නම පැසසේවා
ඒ නම බියකරුවේ උතුමේ
හේළි හේළි වෙති ඒ උතුමාණෝ
මහ බල සම්පන්නේ එතුමෝ

සමිඳාණෝ අප දෙව් ඉසුරාණෝ
අයැදුම් අපගේ සපල කළෝ
දෙවියෝ ඔබ උන් කමා කරන්නෝ
වරදට උන් දඬුවම් කරණෝ